**කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

**තේ පර්යේෂණ මණ්ඩලය**

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# වතු අධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම)

## ශාන්ත කූම්බ්ස් වතුයාය, තලවකැලේ

ඉහත තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තලවකැලේ පිහිටා තිබෙන ශාන්ත කූම්බ්ස් වතුයාය සහ තේ කර්මාන්තශාලාවේ වතු අධිකාරී ලෙස කටයුතු කරමින් ආදර්ශ තේ වතු යායක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා, ඉහළ සුදුසුකම් සහිත විද්‍යාඥයන් කණ්ඩායමක් සමඟ අභියෝගාත්මක පරිසරයක සේවය කළ හැකි විශිෂ්ඨ වැවිලි කරුවකු ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයට අවශ්‍යව තිබේ.

ගැලපෙන සුදුසුකම් සහිත පුද්ගලයකුට මෙම තනතුර තම වෘත්තීමය ප්‍රගමනය වර්ධනය කර ගැනීමටත්, තේ පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයන් සමඟ එක්ව තේ කර්මාන්තය තුළ පිළිගැනීමක් ලබා ගැනීමටත් මෙය අවස්ථාවක් වනු ඇත.

**රැකියා විස්තරය**

තේ කර්මාන්තශාලාව, තේ වතුයාය සහ කාර්යාලයේ පාලනය කිරීමේ සියලුම කාර්යයන් සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම සහ නියාමන සහ අගැයීම් කාර්යයන් සඳහා පාලනාධිකාරියට නිවැරදි තොරතුරු සැපයීම සම්බන්ධ වගකීම දරයි.

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් එකම අවස්ථාවක දී විෂයයන් හයකින් (06) සමත්ව භාෂාව (සිංහල/ දෙමළ), ඉංග්‍රීසි සහ ගණිතය ද ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (04) ලබා තිබීම

**සහ**

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් විෂයයන් තුනක් (03) (පොදු ප්‍රශ්න පත්‍රයෙන් බැහැරව) සමත්ව තිබීම

**හෝ**

ජාතික වෘත්තීය සුදුසුකම්හි (**NVQ**) 05 වැනි මට්ටමට වඩා නොඅඩු, තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද වැවිලි කර්මාන්ත ඩිප්ලෝමාවක නිපුණතා සහතිකයක් ලබා තිබීම.

අයදුම්කරු තේ වතුයායක සහ කර්මාන්තශාලාවක වතු අධිකාරිවරයකු වශයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

මිලදී ගත් දළු කර්මාන්තශාලා මෙහෙයුම් කාර්යයන් පිළිබඳ පළපුරුද්ද ද අවශ්‍ය කෙරේ.

විශිෂ්ඨ අන්තර පුද්ගල සබඳතා, කණ්ඩායම් හැඟීම සහ සාමූහික කාර්ය නිපුණතාව ආදිය අමතර සුදුසුකම් වේ.

සිංහල, ඉංග්‍රීසි භාෂාවෙන්ගෙන් වැඩ කිරීමේ දැනීම, දෙමළ භාෂා කථන හැකියාව වැදගත් වේ.

මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත වන අතර, මූලික වශයෙන් වසර 03ක කාලයක් සඳහා වේ. එය වාර්ෂිකව අලුත් වේ.

**වයස** : අවුරුදු 60ට වඩා අඩුවීම අපේක්ෂා කෙරේ.

**වේතනය** : සියල්ල අඩංගු මාසික පැකේජය දළ වශයෙන් රු. 150,000/- ක් පමණ වේ.

**තෝරාගත් අයදුම්කරුට තේ පර්යේෂණ ආයතනයේ මෙම තනතුරට අදාළ නියමිත අමතර පහසුකම් සලසනු ඇත.**

උප්පැන්න සහතිකයේ පිටපත, විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ අ.පො.ස (සා/පෙ) සහ (උ/පෙ) සහතික (අයදුම්පත සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.) පිටපත්, අදාළ අනෙකුත් අධ්‍යාපන සහතික සහ අනෙකුත් වෘත්තීමය සහතික, සේවා සහතික ආදියෙහි පිටපත් සහ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ඉල්ලුම්කරුගේ පුහුණුව සහ දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන තීරකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද ඇතුළත් කර තම අයදුම්පත ඉදිරිපත් කරන්න.

රජයේ සේවයේ / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ආදියෙහි සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.

තේ පර්යේෂණ ආයතනයේ **www.tri.lk** වෙබ් අඩවියට පිවිස ඉල්ලා තිබෙන තොරතුරු ගූගල් ආකෘතියෙන් උඩුගත කර සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය අදාළ උපකාරක ලේඛන ද සමග ඉදිරි කටයුතු සඳහා 2024 මාර්තු 18 වැනි දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ද කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කරන්න.

**අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්,**
**තලවකැලේ.**